# බැංකු සේවා කළමනාකරු තනතුර

සමිතියේ දැනට පුරප්පාඩු වී ඇති -EL-03 වැටුප් පරිමාණයේ බැංකු සේවා කළමනාකරු තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. තමා විසින් සකස් කරන ලද අයදුම්පත් අදාළ සුදුසුකම් සනාථ කිරීමේ සහතිකවල ඡායා පිටපත් සමග 2025.06.30 දිනට පෙර **"ගරු සභාපති, සී/ස වැලිවිටිය දිවිතුර නව විවිධ සේවා සමුපකාර සමිතිය, තණබද්දේගම, ඇත්කඳුර"** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

| | | |
|---|---|---|
| තනතුර | - | බැංකුසේවා කළමනාකරු |
| කේත අංකය | - | EL-03 |
| ශ්‍රේණිය | - | III ශ්‍රේණිය |
| වයස | - | අවුරුදු 18 - 45 අතර විය යුතුය. |
| සුදුසුකම් | - | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වාණිජ්‍ය කළමනාකරණ, ගණකාධිකරණ, ආර්ථික විද්‍යා යන ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම සහ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ වසර 01 කට නොඅඩු පළපුරුද්ද / පුහුණුව ලබා තිබීම හෝ<br><br>ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලීය රටක වරලත් ගණකාධිකාරී ආයතනයක ආවසරික II හෝ අන්තර් මධ්‍ය පරීක්ෂණය හෝ ගිණුම්කරණය හා ව්‍යාපාරික සහතිකය II හෝ ව්‍යාපාර අදියර විභාගය හෝ ආයතනික අදියර විභාගය හෝ ඊට ඉහළ පරීක්ෂණයකින් සමත්වීම සහ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ වසර 01 කට නොඅඩු පළපුරුද්ද / පුහුණුව ලබා තිබීම හෝ<br><br>SUL මට්ටමේ II ශ්‍රේණියේ සහකාර ගණකාධිකාරී / සහකාර අභ්‍යන්තර විගණක / සහකාර බැංකුසේවා කළමනාකරු තනතුරක වසර 02 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම සහ ගිණුම්කරණය /මූල්‍ය කළමනාකරණය / බැංකුකරණය පිළිබඳ වසර 01 කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම හෝ<br><br>OPL 1 මට්ටමේ 1 ශ්‍රේණියේ බැංකු / ගිණුම් / මූල්‍ය / අලෙවි ක්ෂේත්‍රයේ තනතුරක සේවා කිරීම හා සමුපකාර සංවර්ධන සහතික පත්‍ර උසස් පෙළ විභාගය සමත් වීම / ගිණුම් කරණය / මූල්‍ය කළමනාකරණය / බැංකුකරණය පිළිබද වසර 01 කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම හෝ<br><br>OPL 2 මට්ටමේ 1 ශ්‍රේණියේ බැංකු/ ගිණුම් / මූල්‍ය / අලෙවි ක්ෂේත්‍රයේ තනතුරක වසර 05 ක් සේවය කිරීම හා සමුපකාර සංවර්ධන සහතික පත්‍ර උසස් පෙළ විභාගය සමත් වීම / ගිණුම් කරණය / මූල්‍ය කළමනාකරණය / බැංකුකරණය පිළිබඳ වසර 01 කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම. |
| වැටුප් පරිමාණය | - | 20,000-520X5-600X5-680X10-760X10-840X12-50,080.00<br><br>වැටුපට අමතරව ජීවන වියදම් දීමනා රු.7,500.00ක්ද අතිරේක දීමනා රු.2,500.00ක්ද ගෙවනු ලැබේ.<br><br>දැනට සේවයේ නියුතු සමුපකාර සමිතිවල සේවකයින්ට උපරිම වයස් සීමාවක් බල නොපාන අතර, සිය ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. |

**මෙයට,**
**ගරු සභාපති**
**සී.ස.වැලිවිටිය දිවිතුර නව වි.සේ.ස.සමිතිය**
**තණබද්දේගම - ඇත්කඳුර**

**දුරකථන අංකය**
**091-2291497/ 076-1000180**